සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව-සති පාසල

සැකසුම:-ඇඹිලිපිටිය අධ්‍යාපන කලාපය

8 ශ්‍රේණිය -සිංහල

දෙවන වාරය

පළමු සතිය

## 07 විධි ක්‍රියා හා ආශිර්වාද ක්‍රියා

කිරීමක්,වීමක් හෝ සිදුවීමක් ගැන කියැවෙන පද ක්‍රියා පද ලෙස ඔබ මීට පෙර ඉගෙන ගෙන ඇත.එමෙන් ම වාක්‍යයක ආඛ්‍යාතය ලෙස යෙදෙන ක්‍රියා අවසාන ක්‍රියා ලෙසත් එසේ ආඛ්‍යාත ලෙස නොයෙදෙන ක්‍රියා අනවසාන ක්‍රියා ලෙසත් ඔබ ඉගෙන ගෙන ඇත.

අවසාන ක්‍රියා උදා:-

1. තාත්තා කුඹුර කොටයි. (කිරීමක්)
2. උදයට ඉර පායයි. (වීමක්)
3. තුවාලය රිදෙයි. (විඳීමක්)

අනවසාන ක්‍රියා උදා:-

1. මම උයද ම නැගිට දත් මැද මුහුණ සෝදා බත් කෑවෙමි.
   මෙම වාන්‍යයයේ නැගිට,මැද,සෝදා යන ක්‍රියා පද අනවසාන ක්‍රියා පද වේ.

ක්‍රියාකාරකම 1. අවසාන ක්‍රියාපද සහිත වාක්‍යය පහක් ලියා ක්‍රියා පද යටින් ඉරි අඳින්න.

ක්‍රියාකාරකම 2. අනවසාන ක්‍රියාපද සහිත වාක්‍යය පහක් ලියා ක්‍රියා පද යටින් ඉරි අඳින්න.